# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව

## මහජනයා වෙත නිකුත් කරනු ලබන නිවේදනයයි

**වෘත්තිය වශයෙන් අතරමං නොවන්න; වෛද්‍ය සභාවේ උපදෙස් පතන්න**

පසුගිය දිනවල පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් පළ කරන ලද වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වෙළෙඳ දැන්වීම් කෙරෙහි ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂ අවධානය යොමු විය. උක්ත දැන්වීම් මගින් වෙසෙසින්ම වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුන් දැඩි අවදානමක හෙළනු ලබන බව පෙනී යයි. එවන් අවදානම් සහගත ප්‍රධාන කරුණු කිහිපයක් කෙරෙහි මෙමගින් අවධානය යොමු කෙරේ.

- වෛද්‍ය සභාවේ නිල වශයෙන් පිළිගැනීමට ලක් නොවූ මෙතෙර හෝ එතෙර හෝ, වෛද්‍ය/දන්ත වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සිසුන්ට අනියම් අන්දමින් දිරි දීම.
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිර්ණය කර ඇති අවම සුදුසුකම් සපුරා නොමැති සිසුන් වෛද්‍ය/දන්ත වෛද්‍ය විද්‍යාලවලට වංචා සහගත සහ අනියම් ආකාරවලින් යොමු කිරීම.

මේ සන්දර්භය තුළ වෛද්‍ය සභාව අදාළ සිසුන්ට තරයේ අවවාද කර සිටින්නේ, යථෝක්ත පාඨමාලාවලට යොමු වීමට පෙර සෘජුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී අමතා නිවැරදි තොරතුරු ලබා ගන්නා ලෙසයි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන අතිශයින්ම වැදගත් ප්‍රධාන ප්‍රශ්න දෙකට ලිඛිත පිළිතුරු ලබා ගැනීමට ඔබට පහසුකම් සලසා ඇත.

1. ඔබ ඇතුළත් වීමට අපේක්ෂා කරන වෛද්‍ය/දන්ත වෛද්‍ය විද්‍යාලයේ උපාධිය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම සඳහා පිළිගෙන තිබේ ද?
2. එවැනි පාඨමාලාවකට ප්‍රවේශ වීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් නිර්දේශිත අවම අධ්‍යාපනික සුදුසුකම් ඔබ සපුරා තිබේ ද? අවම සුදුසුකම අ.පො.ස (උ.පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවට පෙනී සිට ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ 2ක් හා සාමාන්‍ය සාමාර්ථ 1ක් එකම විභාගයකදී ලබා තිබීම වේ. ලන්ඩන් Exdecel (උ.පෙළ) හෝ කේම්බ්‍රිජ් (උ.පෙළ) විභාගවල ජීව විද්‍යා විෂය ධාරාවට පෙනී සිටි සිසුන් එකම විභාගයකදී ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා “C” සාමාර්ථ දෙකක් හා ”D” සාමාර්ථ එකක් ලබා තිබීම අනිවාර්ය වේ.

මේ සම්බන්ධයෙන් වෛද්‍ය/දන්ත වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත් වීමට අපේක්ෂා කරන සිසුන් ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කර ගැනීම සඳහා අ.පො.ස (උස්ස පෙළ) හෝ ඒ හා සමාන අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව වෙත යොමු කර ලිඛිත අනුමැතිය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.

තවද විවිධ ආයතන සහ වෛද්‍ය විද්‍යාල මගින් පවත්වනු ලබන පදනම් පාඨමාලා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අ.පො.ස (උස්ස පෙළ) වෙනුවට කිසිසේත්ම පිළිනොගන්නා බව තරයේ අවධාරණය කරනු ලැබේ.

**කිසියම් පුද්ගලයකු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවී ශ්‍රී ලංකාව තුළ බටහිර වෛද්‍ය/දන්ත වෛද්‍ය වෘත්තියෙහි නියැලීම දඬුවම් ලැබිය හැකි නීති විරෝධී ක්‍රියාවක් බව අවධාරණයෙන් දන්වා සිටිමි.**

වෛද්‍ය එස්. ටෙරන්ස් ජී.ආර්. ද සිල්වා
ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව,
අංක. 31, නොරිස් කැනල් පාර,
කොළඹ 10.
දුරකථන අංකය : 011-2691848
2016.08.24